# කොවිඩ් 19 - සති පාසල 10 ශ්‍රේණිය

## 2 වන පාඩම - ශ්‍රී ලංකාව ජනාවාස වීම

සැකසුම - M.P.A ප්‍රදීප් කුමාර                                   කෑ / දෙහි කිතලංගමුව ක . වි

### හැඳින්වීම

- ශ්‍රී ලංකාවේ මනුෂ්‍ය පැවැත්මේ ඉතිහාසය ප්‍රධාන අවධි තුනකට බෙදා තිබේ.
- සාහිත්‍ය මූලාශ්‍රය මඟින් විස්තර කෙරෙන අතීතයට පෙර අවධිය එනම් පුරාවිද්‍යාත්මක සාධක මත පමණක් පදනම් වී ඉතිහාසය හදාරන අවධිය ප්‍රාග් ඓතිහාසික අවධිය ලෙස හඳුන්වයි.,
- ප්‍රාග් ඓතිහාසික යුගය ප්‍රධාන අවධි දෙකකට බෙදා දක්වයි. ඉන් පළමුවැන්න ප්‍රාග් ඓතිහාසික යුගය හෙවත් ගල් යුගයයි. දෙවැන්න පූර්ව ඓතිහාසික යුගයයි.
- ප්‍රාග් ඓතිහාසික අවධියේ ජනවාස ව්‍යාප්තිය කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක කිහිපයකි. මේ අවධියේ දී ප්‍රධාන පරිසර කලාප 06 ක් පුරා ජනාවාස ව්‍යාප්ත වී තිබේ.

### ක්‍රියාකාරකම

01) ප්‍රාග් ඓතිහාසික යුගය යන්න කෙටියෙන් හඳුන්වන්න.

02) ගල් යුගයේ මුල් අවධියට අයත් සාක්ෂි හමුවන ප්‍රධාන පුරාවිද්‍යාත්මක ස්ථාන දෙක කුමක්ද?

03) ප්‍රාග් ඓතිහාසික යුගයේ දී ජනාවාස ව්‍යාප්ත වූ පරිසර කලාප අනුව මානවයාගේ වෙනස්කම් ඇති වූ බව සාධක දෙකක් ඇසුරින් පහදන්න.

04) ප්‍රාග් ඓතිහාසික ජනාවාස ආශ්‍රිතව සිදු කළ කැණීම් මඟින් අනාවරණය කරගත් කාල වකවානුව ඇතුලත් ලැයිස්තුවක් සකස් කරන්න

05) පහත දැක්වෙන ස්ථාන ලංකා සිතියමක ලකුණු කර නම් කරන්න.
ඉරණමඩු , රත්නපුරය , පාහියන්ගල , කුරුවිට බටදොඹලෙන , කිතුල්ගල බෙලි ලෙන
බෙල්ලන්බැඳිපැලැස්ස , මානියංගම , සීගිරිය , පොතාන , අලිගල

06) පහත සටහන සම්පූර්ණ කරන්න

